# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2475/06 - 2026 පෙබරවාරි මස 10 වැනි අඟහරුවාදා - 2026.02.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**එල්.ඞී. බී. 94/47(IX)**

**(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**

6(2)(ආ) සහ 21(2)(ආ) වගන්තිය යටතේ වන නියමය

(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2)(ආ) වගන්තිය සහ 21(2)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍ය බිමල් නිරෝෂන් රත්නායක වන මා විසින් මේ නියමය මගින්-

(අ) මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති "ශ්‍රී බෝධිරුක්ඛාරාම විහාර භූමි ප්‍රදේශය" ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා නාගරික සංවර්ධන භූමි ප්‍රදේශයක් බවට මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ; සහ

(ආ) නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ඉහත ප්‍රකාශයට පත් කරන ලද "ශ්‍රී බෝධිරුක්ඛාරාම විහාර භූමි ප්‍රදේශය" සඳහා පරිබාහිර භෞතික සැලැස්මක් සකස් කළ යුතු බවට විධානය කරනු ලැබේ.

බිමල් නිරෝෂන් රත්නායක,
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය.

2026 ජනවාරි මස 5 වන දින,
කොළඹ දී ය.

1A - G 46266 — 13 (2026/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

**ශ්‍රී බෝධිරුක්ඛාරාම විහාරය සංයුක්ත වන භූමි ප්‍රදේශය**

වයඹ පළාතේ, කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉපලෝගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ (ග්‍රා.නි.කො. අක්ෂර 167), ඉපලෝගම ග්‍රාමයෙහි පිහිටි, සර්වේයර් ජනරාල්වරයාගේ 2024 නොවැම්බර් මස 27 වන දිනැති කේ. යූ/ එම්. එච්.ඩබ්/2024/93 දරන අනුරේඛණයේ කැබලි අක්ෂර ‘ඒ’ (හෙක්ටයාර් 0.0940) සහ කැබලි අක්ෂර ‘බී’ (හෙක්ටයාර් 0.0227) කැබලි අක්ෂර ‘සී’ (හෙක්ටයාර් 0.9111) කැබලි අක්ෂර ‘ඊ’ (හෙක්ටයාර් 0.0214) කැබලි අක්ෂර ‘එෆ්’ (හෙක්ටයාර් 0.2021) වශයෙන් නිරූපිත හෙක්ටයාර් 1.2513ක විශාලත්වයෙන් යුක්ත පහත දැක්වෙන පරිදි මායිම් වූ භූමි ප්‍රදේශය :-

| | | |
|---|---|---|
| **කැබලි අක්ෂර ‘ඒ’** | - | **තිඹිරිවලහේන (හෙක්ටයාර 0.0940)** |
| උතුරට | - | මාර්ගය (ප්‍රාදේශීය සභා); |
| නැගෙනහිරට | - | කැබලි අක්ෂර ‘බී’, ආර්. අයි. බී. මැණික්රාල සහ තවත් අය විසින් හිමිකම් කියන බෝගහ අස්වැද්දුම සහ කැබලි අක්ෂර ‘ඩී’ (ඇළ); |
| දකුණට | - | කැබලි අක්ෂර ‘සී’සහ ආර්. අයි. බී. සේනාරත්න හිමිකම් කියන සූරියගහමුලවත්ත; සහ |
| බටහිරට | - | රජය හිමිකම් කියන තිඹිරිවලහේන. |
| **කැබලි අක්ෂර ‘බී’** | - | **බෝගහවැව සහ බෝගහහේන (හෙක්ටයාර 0.0227)** |
| උතුරට | - | මාර්ගය (ප්‍රාදේශීය සභා); |
| නැගෙනහිරට | - | ආර්. අයි. බී. මැණික්රාල සහ තවත් අය විසින් හිමිකම් කියන බෝගහ අස්වැද්දුම සහ කැබලි අක්ෂර ‘ඩී’ (ඇළ) සහ කැබලි අක්ෂර ‘ඒ’; |
| දකුණට | - | කැබලි අක්ෂර ‘ඩී’ (ඇළ) සහ කැබලි අක්ෂර ‘ඒ’ (ඇළ); සහ |
| බටහිරට | - | කැබලි අක්ෂර ‘ඒ’ |
| **කැබලි අක්ෂර ‘සී’** | - | **සියඹලාගහවත්ත සහ බෝගහහේන (හෙක්ටයාර 0.9111)** |
| උතුරට | - | රජය හිමිකම් කියන තිඹිරිවලහේන සහ කැබලි අක්ෂර ‘ඒ’; |
| නැගෙනහිරට | - | කැබලි අක්ෂර ‘ඩී’ (ඇළ); |
| දකුණට | - | කැබලි අක්ෂර ‘ඩී’ (ඇළ) සහ මාර්ගය ; සහ |
| බටහිරට | - | මාර්ගය, ආර්. අයි. බී. ජයසේකර සහ තවත් අය විසින් හිමිකම් කියන සූරියගහමුලවත්ත සහ ආර්. අයි. බී. සේනාරත්න විසින් හිමිකම් කියන සූරියගහමුලවත්ත. |
| **කැබලි අක්ෂර ‘ඊ’** | - | **සියඹලාගහවත්ත සහ බෝගහහේන (හෙක්ටයාර 0.214)** |
| උතුරට | - | කැබලි අක්ෂර ‘ඩී’ (ඇළ); |
| නැගෙනහිරට | - | කැබලි අක්ෂර ‘ඩී’ (ඇළ); |
| දකුණට | - | කැබලි අක්ෂර ‘ඩී’ (ඇළ); සහ |
| බටහිරට | - | ඇළ සහ කැබලි අක්ෂර ‘ඩී’ (ඇළ) |
| **කැබලි අක්ෂර ‘එෆ්’** | - | **බෝගහහේන සහ පිංලියද්ද (හෙක්ටයාර 0.2021)** |
| උතුරට | - | කැබලි අක්ෂර ‘ඩී’ (ඇළ)සහ කැබලි අක්ෂර ‘ජී’ ; |
| නැගෙනහිරට | - | ආර්. එම්. පුංචිබණ්ඩා සහ තවත් අය විසින් හිමිකම් පාන කඳුරුගහකුඹුර, ආර්. අයි. බී. කපුරුබන්ඩා විසින් හිමිකම් කියන කඳුරුගහකුඹුර සහ ඇළ; |
| දකුණට | - | (ඇළ); සහ |
| බටහිරට | - | කැබලි අක්ෂර ‘ඩී’ (ඇළ) |

EOG 02 - 0074

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.